www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය ශ්‍රී ලංකාවේ යුද්ධයේ දී ඝාතනය වූ සොල්දාදුවන්ගේ පවුල් සමග කතා කරයි

## WSWS speaks to families of soldiers killed in Sri Lanka's war

**අප වාර්තාකරුවන් විසිනි**
**2006 අගෝස්තු 25**

ශ්‍රී ලාංකික මිලිටරිය දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය යුද්ධය දිගින් දිගට ම ගෙන යන තත්ත්වය තුළ, මිය ගිය හා තුවාල ලත් සොල්දාදුවන් සංඛ්‍යාව නාටකාකාර ලෙස ඉහළ යමින් පවතී. අනතුරට පත් වූවන් පිලිබඳ නිල සංඛ්‍යා ලේඛන අනුව, අගෝස්තු මස මුල පටන් සිදු වූ සටන්වල දී මිලිටරි කාර්ය භටයන් 159 දෙනෙකු ඝාතනයට ලක්ව ඇති අතර තවත් 452 දෙනෙකු තුවාල ලබා තිබේ.

මාවිල්ආරු වාරිමාර්ග සොරොව්ව අල්ලා ගැනීම පිනිස කීප දහසක හමුදාවක් සම්බන්ධ කර ගත් "සීමිත, මානුෂීය" ප්‍රහාරයක් දියත් කරන ලෙස ජූලි 26 දා ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රකෝපකාරී ලෙස අන කලේ ය. එවක් පටන්, යාපන අර්ධද්වීපයෙහි අඛන්ඩව සිදු වන ගැටුම් සමග දිවයිනේ උතුරේ හා නැගෙනහිරේ අනෙකුත් කොටස්වලට ද සටන පැතිරී තිබේ. 2002 සටන් විරාම ගිවිසුම ඇත්ත වශයෙන් ම මළ ලියවිල්ලක් බවට පත්ව තිබේ.

යලි වතාවක් සටනේ දී ඝාතනයට ලක් වූ සොල්දාදුවන්ගේ මිනී පෙට්ටි දකුනට එවනු ලැබේ. බොහෝ හමුදා භටයන් සිය පවුල් වෙනුවෙන් ආදායමක් උපයා ගැනීම සඳහා හමුදාවට බැඳුනු දුප්පත් ගම්බද තරුනයන් වන අතර, අනතුරුව යුද්ධයේ තුවක්කු බත් ලෙස යොදා ගැනුනි. "මව්බිම වෙනුවෙන් කරන ශ්‍රේෂ්ඨ කැප කිරීමක්" පිලිබඳ දේශප්‍රේමී වාග් පාඨ හඬ තලමින් වර්ධනය වන දුක්ඛාන්ධකාරයෙන් අවධානය වෙනතකට යොමු කිරීමට ආන්ඩුව, මාධ්‍ය හා සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් ප්‍රයත්න දරති.

කෙසේ වුව ද, මිය ගිය සොල්දාදුවන්ගේ පවුල් සමග කතා කල අවස්ථාවල දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරුවන් නිශ්චය කර ගත් පරිදි, දුප්පත් වැඩ කරන ජනයාට යලි වතාවක් යුද්ධයේ පීඩාව දැරීමට සිදු වීම පිලිබඳව සැලකිය යුතු අපේක්ෂා භංගත්වයක් හා කෝපයක් මතුව පවතී.

**චම්පික ප්‍රසාද්** නම් 19 වියැති සොල්දාදුවා රොකට්ටුවකින් විදින ලද ග්‍රෙනේඩ් බෝම්බ ප්‍රහාරයකින් මුහමලේ දී ඝාතනයට ලක් විය. එල්ටීටීඊය යාපන අර්ධද්වීපයේ උතුරු දෙසට පෙරට යාම සඳහා උත්සාහ දැරූ හෙයින් අගෝස්තු 11 දා රාත්‍රියෙහි දරුනු සටන් ඇති විය. මුහමලේ යනු එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශය ආසන්නයේ ඇති හමුදාවේ ඉදිරි ආරක්ෂක වලල්ලේ ප්‍රධාන මධ්‍යස්ථානයකි.

පාසල හැර ගොස් වැඩි කලක් ගත වීමට මත්තෙන් 2005 මාර්තු මස යුද හමුදාවට එක් වූ ප්‍රසාද් පසු ගිය දෙසැම්බරයේ දී මුහමලේ ඉදිරි ආරක්ෂක වලල්ලේ සේවයෙහි යෙදවුනි. ඔහු අවසන් වරට සිය පවුලේ සාමාජිකයන් මුන ගැසුනේ ජූලි 13 වන දා ය. මුද්‍රා තැබූ පෙට්ටියක බහා ඔහුගේ දේහය ආපසු එවා තිබින. ඔහුගේ පවුලේ සාමාජිකයන් පවසන පරිදි ඔහුගේ මුහුන දැඩි ලෙස විකෘතව තිබුනි.

ඔහුගේ නිවස පිහිටියේ කොලඹින් කිලෝමීටර 80ක් පමන දුරින් කුරුනෑගල දිස්ත්‍රික්කයේ පිහිටි දිලිඳු, හුදෙකලා ගම්මානයක් වූ නෙත්තිපොල ය. ගමට ලඟා වීම සඳහා පවතින එක ම ක්‍රමය වන්නේ ආසන්නම නගරය වන කුලියාපිටියේ සිට ධාවනය වන කුඩා බස් රථය පමනි. පාසල් දිවිය හමාර කිරීමෙන් පසුව බොහෝ තරුනයන්ට රැකියා අවස්ථා නො ලැබේ. ඔවුන්ට ඉතිරි වන එක ම විකල්පය වනුයේ හමුදාවට බැඳීම පමනකි.

තම පවුලේ සාමාජිකයන් ඔහු හමුදාවට එක් වනවාට අකැමැති වූ බව ප්‍රසාද්ගේ පියා වන පී. සිම්පීනුස් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසී ය. එහෙත් ඔහුට රැකියාවක් නොලැබුනු අතර හමුදාවේ බඳවා ගැනීම් පිලිබඳ දැන්වීම කෙරෙහි ඔහුගේ සිත ඇදී ගියේ ය. "සටන් විරාමය හොඳ දෙයක්. ඒත් [එල්ටීටීඊය] රට බෙදනවාට අපි කැමති නැහැ. සාමකාමීව ප්‍රශ්නය විසඳ ගන්න පුලුවන් නම් හොඳයි. මගේ පුතා කීප වතාවක් ගෙදර ආවා. තමුන් හමුදාවට කැමති බව කිව්වත් තමුන්ගෙ බාල මල්ලිට හමුදාවට බැඳෙන්න ඉඩ දෙන්න එපා කියල එයා අම්මගෙන් ඉල්ලා හිටියා."

ප්‍රසාද්ගේ සීයා වූ පී. රන්කිරා යුද්ධය සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් නගනු වෙනුවට සිංහල වර්ගවාදී පක්ෂවලට චෝදනා කලේ ය. දෙමල, මුස්ලිම් හා සිංහල ජනයා කලින් ප්‍රදේශය තුල එකට ජීවත් වූ සැටි ඔහු පහදා දුනි. යාපනයෙන් ආ දෙමල ගුරුවරු මුස්ලිම් පාසල්වල සේවය කලහ. යුද්ධය සඳහා බලපෑ ප්‍රධාන හේතුව 1983 දෙමල විරෝධී කැරලි බව ඔහු කී ය. සිංහල මැරයන් දෙමල ජනයාට අයත්ව තිබූ කඩසාප්පු ගිනි තැබූ අයුරු හේ සිහිපත් කලේ ය. "යුද්දෙ පටන් ගත්තෙ එහෙම යි. මම සිංහල හෝඩිය වත් දන්නෙ නෑ. ඒත් මට ඒක තේරුම් ගියේ එහෙම යි," ඔහු පැවසී ය.

එමෙන් ම, 1989 දී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් ගෙන යන ලද ස්වෝත්තමවාදී ත්‍රස්ත ව්‍යාපාරය පිලිබඳව ද ඔහු කතා කලේ ය. "ඒ දවස්වල ඒ ගොල්ලන්ගෙ තර්ජන නිසා අපි හවස 5 වෙන කොට අපේ ගෙවල්වල දොරවල් වැහුවා. දැන් යුද්දෙ අරන් එන්නෙ ඒ ගොල්ල තමයි. සමහර හාමුදුරුවරුත් යුද්ධය ඉල්ලා හිටිනවා."

ප්‍රසාද්ගේ වැඩිමහල් සොහොයුරා කියා සිටියේ, පවත්නා දුෂ්කරතාවන් නිසා ගොවිතැන් කටයුතු කෙරෙහි ප්‍රසාද්ගේ කැමැත්තක් නොවූ බව යි. වී සහ අනෙකුත් බෝග වගා කිරීම පිනිස පවුල සතුව තිබෙන්නේ හෙක්ටෙයාරයකටත් අඩු ඉඩම් කැබැල්ලකි. පසු ගිය කන්නයේ දී ඔවුහු තමන්ගේ මුලු වී අස්වනු ප්‍රමානය විකුනා ගැනීමට අසමත් වූහ, විකුනා ගත් වී ටිකට ද ලැබුනේ අඩු මිලකි. අවමගුල් කටයුතුවල වියහියදම් පියවා ගැනීම සඳහා ආන්ඩුව ඔවුන්ට රුපියල් 300,000ක් ගෙවා තිබුනි.

ප්‍රසාද්ගේ ගමට කිලෝමීටර 15ක් දුරින් පිහිටි ඇල්හිටියාවේ පදිංචිකරුවෙකු වූ 26 හැවිරිදි **අසේල තිලකරත්න** නැගෙනහිර පලාතේ පිහිටි මුතුර් නගරයේ දී අගෝස්තු 2 වන දා ඝාතනයට ලක් විය. ඔහුට බිරිඳක හා දරුවෙක් සිටියේ ය.

අසේල ගේ මව වන සුමනාවතී මෙසේ කී යː "අසේල හමුදාවට බැඳුනේ 2000 දි. එයා අමාරුවෙන් ගෙදර ආවෙ 20001 දි තාත්තගෙ මලගමට විතර යි. මගේ දූ විස්කෝතු නිපදවන ෆැක්ටරියක වැඩ කරනවා. පිටි මිල වැඩි වෙමින් තියෙන හින්දා ඒකත් වහන්න යනව. ඈ මාසෙකට හම්බ කරන්නේ රුපියල් 3,000ක් විතර යි. මගේ අනිත් පුතා පුහුනු වෙන සේවකයෙක් විදියට කොලඹ ගැරේජ් එකක වැඩ කරනවා. ඒත් ආදායමක් ලැබෙන්නේ නැහැ."

අසේලගේ බිරිඳ වන ක්‍රිෂාන්ති නදීකා මෙසේ පැහැදිලි කලේ යː "අසේල මාස දෙකකින් විතර ගෙදර ආවෙ නැහැ. එහේ හැම තැන ම ක්ලේමෝ බෝම්බ තියෙන බව පහු ගිය වතාවෙ එයා කිව්ව. එයා මැරුනෙ මෝටාර් ප්‍රහාරයකින්. තිරිකුනාමලේට ගියපු එයාගෙ සහෝදරයො එයා අඳුන ගත්තා. අපි ඉන්නෙ බලාපොරොත්තු සුන් වෙච්ච තත්ත්වෙක, අපට මොකක් සිද්ධ වෙන්න යනවා දැයි අපි දන්නෙ නැහැ.

"අපි යුද්දෙට කැමති නැහැ. යුද්දේ ඉවර වේ ද සාමයක් ඒවි ද කියල අපි දන්නෙ නැහැ. යුද විරෝධී රැස්වීමක දි හාමුදුරුවරු කලේ මොකද්ද කියල අපි රූපවාහිනියෙන් දැක්ක. ඒ ගොල්ලො යුද්දෙ ඉල්ලනව." පසු ගිය සතියේ දී යුද විරෝධී රැලියක කථිකයන්ට පහර දුන් බෞද්ධ භික්ෂූහු රැස්වීම කඩාකප්පල් කිරීමට ප්‍රයත්න දැරූහ.

ජුලි 31 දා **එච්.එම්. සෝමතිලක රනසිංහ** ඝාතනයට ලක් වූයේ මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීම සඳහා කල මිලිටරි ආක්‍රමනය අතරතුර දී ක්ලේමෝ බෝම්බයකිනි. 1991 දී ඔහු හමුදාවට එක් වූයේ කුලියාපිටියෙහි ඇටම්පොල පාසලේ අපොස සාමාන්‍ය පෙල දක්වා අධ්‍යාපනය ලැබීමෙන් පසුව ය. ඔහු මියෙන විට ජීවත් වෙමින් සිටියේ බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි රිල්පොල ගම්මානයෙහි ය.

ඔහුගේ මව වන මැගිලින් නෝනා, වයඹ පලාතේ නාරම්මල ගමේ දී දරුවන් හත් දෙනෙකුගෙන් යුතු සිය පවුල අතිශය දුෂ්කර ජීවිතයක් ගෙවූ බව විස්තර කලා ය. ඇගේ ස්වාමිපුරුෂයා හා පවුලේ අනෙකුත් සාමාජිකයෝ සාමාන්‍ය කම්කරුවන් ලෙස සේවය කලහ. ඇගේ දරුවන්ගෙන් හතර දෙනෙකු යම් ජීවිකාවක් සපයා ගැනීම පිනිස හමුදාවට බැඳුනු නමුත් ඇගේ දියනිය හා වැඩිමල් පුතනුවෝ මෑතක දී රැකියාවෙන් ඉල්ලා අස් වූහ. බාල ම පුතු තව මත් සේවයෙහි නියැලී සිටියි.

"යුද්දෙ නිසා අපට අපේ පුතා නැති වුනා. අපි දැන් වයස යි. අපි රැක බලා ගන්න කිසි කෙනෙක් නැහැ. වගා කරන්න අපට අයිති කුඩා ඉඩම් කෑල්ලක් වත් නෑ. ආපහු කම්කරු රස්සාවට යනවා හැරෙන්න ජීවිතෙ රැක ගන්න වෙන ක්‍රමයක් නැහැ."

තම දරු දෙදෙනාත් සමග තමන් මුලුමනින් ම අසරන වූ බවක් හැඟෙන්නේ යැයි සෝමතිලකගේ බිරිඳ වන එච්.එම්. රූපවතී කී යː "රුපියල් ලක්ෂ ගානකින් හරි නෑදෑයන්ගෙන් හරි මේ අඩුව පිරවෙන්නෙ නෑ. මගේ විවාහයට කලින් මම ගාමන්ට් එකක වැඩ කලා. දැන් මට එතන වැඩ කරන්න බැහැ. ඒක දැන් මාස ගානක් තිස්සෙ වහල දාල."

දෙවසක් වයසැති තම දියනිය තම පියා ගැන අසන බව ඇය කියා සිටියා ය. "මම දැන් මොකක් කරන්නද? මම යුද්දෙට විරුද්ධ යි. යුද්දෙ නිසා මම වගේ තව කී දෙනෙක් අසරන තත්ත්වයට පත් වෙලා ඇද්ද? සටන්

විරාමෙ කාලෙ දි අපි සතුටින් හිටියා. යුද්දෙ නැති නිසා මගේ සැමියත් සතුටින් සිටියා."

සෝමතිලකගේ තවත් ඥාතියෙකු වන ඩබ්ලිව්.පී. කරුනාරත්න ජවිපෙහි ක්‍රියා කලාපය පිලිබඳව කෝපයෙන් කතා කලේ ය. "දැන් ජවිපෙ යුද්දෙට දහිරිය දෙනවා. කලින් [1980 ගනන්වල] ඒ ගොල්ලො දේශප්‍රේමී යුද්ධයක් වෙනුවෙන් උද්ඝෝෂනය කලා. ඔවුන් මිනිස්සුන්ට තර්ජනය කරලා වර්ජනය කරන්න කියල ඉල්ලා සිටියා. මහවැලි වාරිමාර්ග යෝජනා ක්‍රමයෙ වැඩ කරමින් ඉන්න කාලෙ මම මේකට මුහුන දුන්නා.

"රස්සාවල් වත් මොන විදියක හරි අනාගතයක් වත් නැති දුප්පත් තරුනයො හමුදාවට බැඳිලා දුසිම් ගනනින් මැරෙනවා. දේපල හරි වරප්‍රසාද හරි තියෙන කිසි කෙනෙක් සටනට යන්නෙ නැහැ. මැරෙන්න කිසි කෙනෙකුට ඕන නැහැ. හැම දෙනාට ම ඕන කරන්නෙ සාමය."

38 වියැති **කෝප්‍රල් ආර්. සිරිවර්ධන** අගෝස්තු 14 වන දා නාගර්කෝවිල්හි සටනේ දී මිය ගියේ ය. ඔහුගේ පියා දුම්රිය සේවකයෙකු වූ අතර, ආන්ඩුවේ සුභසාධන වැඩ සටහනකින් මසකට ලැබෙන රුපියල් 350න් ඔවුහු දිවි ගැට ගහ ගනිති. ඔහුගේ කුඩා නිවස පෙන්වූ ඥාතියෙකු කීවේ, ඒ තුල 10 දෙනෙකුට වත් සිටීමට ඉඩ නැති හෙයින් ඔහුගේ පවුලට අවමංගල්‍යය එහි පැවැත්වීමට නුපුලුවන් වූ බව යි.

"මේ යුද්දෙ නවත්තන්න ඕන. මේක ජාතිවාදී යුද්ධයක්. මේ යුද්දෙ දි දුප්පත් මිනිස්සු මියැදෙනව," ඔහු කෝපයෙන් කී ය.

© www.wsws.org